# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1643/45 – 2010 මාර්තු 05 වැනි සිකුරාදා – 2010.03.05

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, ඌරවත්ත, වලව්වත්ත ධීවර නිවාස ඉදිකිරීම සඳහා ආණ්ඩුවට අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති බවත් එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඌරවත්ත ගමේ පිහිටි, ගාල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් 2008 ජූලි මස 13 වැනි දිනැතිව සකස් කර ඇති අංක ජීඒ/එච්කේකේ/07/1310 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0506 ක් පමණ වූ පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් හා මායිම්වලින් යුක්ත ඉඩම් කොටස් දෙක:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0048 ක් පමණ**

උතුරට: මාර්ගය, මු. පි. ගා. 2810 හි කැබලි අංක 4 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී, මු. පි. ගා. 2810 හි කැබලි අංක 4 සහ මාර්ගය; දකුණට සහ බටහිරට: මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – වලව්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0458 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: මු. පි. ගා. 2810 හි කැබලි අංක 4; දකුණට: මු. පි. ගා. 2810 හි කැබලි අංක 4 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ මු. පි. ගා. 2810 හි කැබලි අංක 4.

ජීවන් කුමාරණතුංග,<br>
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ<br>
යොමු අංකය: එල්ඩී/05/2006/එෆ්එච්/458.<br>
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: හික්/ඉඅ/05/471 (iii).<br>
2009 ජූලි මස 21 වැනි දින,<br>
'ගොවිජන මන්දිරය',<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

03 – 741

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.